කොවිඩ්-19 වාර්තාකරණය සම්බන්ධයෙන් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය මගින් නිකුත් කොට ඇති නිර්දේශයන්හි , 'වෛරසය ආසාදිත පුද්ගලයින් "රෝගීන්" මිස අනෙක් අයට "රෝගය පතුරුවන්නන්" ලෙසින් හැඳින්වීමෙන් වලකින' ලෙසින් සඳහන් වේ. කොවිඩ්-19 වාර්තාකරණයේදී ජනමාධ්‍ය මෙම නිර්දේශය හා අනුකූල වීම අත්‍යාවශ්‍ය වනුයේ, ඒ ඔස්සේ කොවිඩ්-19 ආසාදිතයන් සම්බන්ධයෙන් සමාජය තුළ කොන් කිරීමේ ආකල්පයක් ඇතිවීමට ඇති හැකියාව අවම කළ හැකි වීම සහ ඒ ඔස්සේ රෝගීන් නිසි වෛද්‍ය උපදෙස් හා ප්‍රතිකාර නොගෙන සැඟවීමට ඇති ඉඩ අවම කළ හැකි වීම නිසායි.

කෙසේ නමුත් තවමත් ඇතැම් මාධ්‍ය මෙම නිර්දේශයන් පසෙක ලා සිය වාර්තාකරණයන් සිදුකරනු දැකීමට හැක. පහත දැක්වෙන අරුණ (10/22) සහ මව්බිම (10/22) පුවත් වාර්තාවන් ඊට උදාහරණ වේ. මෙම සිරස්තල යෙදීමේදී අදාළ ආසාදිතයින් ඊට වගකිවයුත්තන් හෝ වරදකරුවන් ලෙසින් නොදැක්වීමට හැකියාවක් නොතිබුණිදැයි අප මෙහිදී විමසිය යුතු වෙයි.

කොවිඩ්-19 පිළිබඳ වාර්තාකරණයේදී මාධ්‍ය මඟින් කොවිඩ්-19 ආසාදිතයන් සහ නිරෝධායනයට ලක් කරන්නන් සමාජයේ කොන් කිරීමකට ලක් වන ආකාරයෙන් පුවත් ඉදිරිපත් කිරීම, ආචාරධාර්මික උල්ලංඝනයක් සහ මේ මොහොතේ මාධ්‍ය අත රැඳි සමාජ වගකීම උල්ලංඝනය කිරීමක් බව අපි නැවතත් ප්‍රකාශ කරමු.

**#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #NewsPapers #Coronavirus # Mawbima #Aruna**